1st Place Winner
National Productivity
Award 2020

SLSI
SYSTEM CERTIFIED
ISO 9001

SLAB
ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/7/1/3 | ඔබේ අංකය / உமது இல / Your Ref. | දිනය / திகதி / Date 2025.03 27 |

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 01/2025**

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා
ගණන්දීමේ නිලධාරීන් වෙත.

**<u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2024</u>**

දකුණු පළාත් මුදල් රීති 76.2.5 අනුව, **"පළාත් සභාව සතු වූ හෝ පළාත් සභාව භාරයේ පවත්නා මුදල්, භාණ්ඩ, උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම"** ගණන්දීමේ නිලධාරීන් ගේ වගකීමක් වන්නේ ය. ඒ අනුව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමේ දී මු.රී 476 හා මු.රී 477 අනුව දකුණු පළාතේ සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් තම අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට අයත් සියලුම ආයතනවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිවැරදිව සිදු වන බවට තහවුරු කිරීමක් ලබා ගත යුතු අතර, භාණ්ඩ සමීක්ෂණ සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම, ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, ගැටලු ඇත්නම් ඒවා නිවැරදි කිරීම, උපදෙස් ලබා දීම හා ඒ සම්බන්ධ පසු විපරම් කටයුතු සිදු කිරීම කළ යුතු ය.

02. පසුගිය වර්ෂයන්හි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන්ට අදාළ පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා නොකිරීම තුළ, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සම්පූර්ණයෙන්ම අවසන් නොවී පවතින අවස්ථා ඇති බැවින්, සියලුම ආයතනවල 2024.12.31 දිනට සිදු කරනු ලබන භාණ්ඩ සමීක්ෂණ වලදී ආයතනවල ගොඩ ගැසී ඇති ප්‍රයෝජනයට ගත නොහැකි සියලුම භාණ්ඩ පිළිබඳ තොරතුරු පොදු 47 ආකෘතියට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර වීමටත් එකී භාණ්ඩ සඳහා සුදුසු පරිදි (විනාශ කිරීම, අලුත්වැඩියා කිරීම, වෙන්දේසි කිරීම හෝ හුවමාරු කිරීම) කටයුතු කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී /ගණන්දීමේ නිලධාරී ලෙස ඔබගේ පෞද්ගලික අවධානය යොමු කිරීමට මින් උපදෙස් ලබා දෙමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත්- අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, දකුණු පළාත.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"